# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 04

## මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි - බහුවරණ ප්‍රශ්න

1) ලී බඩු මිලදී ගෙන අලෙවි කරනු ලබන ව්‍යාපාරයක පහත සඳහන් ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලික සටහන් පොත් නම් කරන්න.

(1) ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා ලී බඩු ණයට මිලදී ගැනීම. -.......... .................................
(2) ලී බඩු මිලදී ගත් ගනුදෙනුකරුවෙකුගෙන් මුදල් ලබා ගැනීමේදී වට්ටමක් ලබා දීම.- .............................................
(3) ලී බඩු තොග ආපසු යැවුම් - ...........................................
(4) ව්‍යාපාරයේ විදුලි බිල ගෙවීම. - ...........................................
(5) අලෙවි කිරීමට ලී බඩු ණයට මිලදී ගැනීම. - ............................................

2) ගිණුම් වර්ෂය අවසානයේ ව්‍යාපාරයේ පවතින සියලු ආදායම් හා වියදම් ගිණුම් ආදායම් ප්‍රකාශයට මාරු කිරීමට අදාළ මූලික සටහන් යෙදිය යුතු වන්නේ,

(1) පොදු ජ'නලය මඟිනි.
(2) මුදල් ලැබීම් ජ'නලය මඟිනි.
(3) සුළු මුදල් ගෙවීම් ජ'නලය මඟිනි.
(4) ආරම්භක සටහන් මඟිනි.
(5) ආපසු යැවුම් ජ'නලය මඟිනි.

3) පහත තොරතුරු ABC ව්‍යාපාරයේ ජනවාරි මාසයට අදාළ වේ.

- 01/01 - අයිතිකරු අමතර ප්‍රාග්ධනය මුදලින් යෙදවීම - රු.5,000යි.
- 01/08 - රු. 100,000ක තොග මිලදී ගැනීම.
- 01/15 - 01/08 මිලදී ගත් තොගයෙන් 50%ක් පිරිවැය වූ තොග විකිණුම් මිලට 20%ක ලාභ තබා ණයට විකිණීම.
- 01/20 - යන්ත්‍රයක් ණයට මිලදී ගැනීම.
- 01/30 - අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු.10,000යි.

වාණිජ ධාරාව අධ්‍යයන පොදු

1. ඉහත 01/01, 01/20 සහ 01/30 සිදු වූ ගනුදෙනු වලට අදාළ මූලාශ්‍ර ලියවිලි පිළිවෙලින් වන්නේ,

(1) ලදුපත, ජ'නල් වවුචරය, ජ'නල් වවුචරය
(2) ජ'නල් වවුචරය, ජ'නල් වවුචරය, ජ'නල් වවුචරය
(3) ලදුපත, මුදල් ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය
(4) ජ'නල් වවුචරය, මුදල් ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය
(5) ලදුපත, විකිණුම් ඉන්වොයිසිය, ගැණුම් ඉන්වොයිසිය

2. ජනවාරි මස මුල් තොගයේ අගය රු.20,000ක් නම්, මෙම ගනුදෙනු අවසානයේ අවසාන තොගයේ අගය කීයද ? ............................................

4) පහත ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලියවිලි මොනවාද?

1. ලද වට්ටම්
2. බැංකු ගාස්තු
3. බොල් ණය
4. වැටුප් හා වේතන

5) පහත ප්‍රකාශ සත්‍යද? අසත්‍යද?

1. VAT ගිණුමේ ශේෂය සැම විටම හර ශේෂයකි. (    )
2. ඉඩම් අලෙවිකරණ ව්‍යාපාරයක ඉඩම් ණයට මිලදී ගැනීම ගැනුම් ජ'නලයේ වාර්තා කරයි.(    )
3. ආපසු එවුම් ජ'නලයට අදාළ මූලාශ්‍ර ජනලය හරපතයි. (    )
4. ණයගැති පාලන ගිණුම බැර කර ණයහිමි පාලන ගිණුම හර කිරීම ප්‍රතිපියවීමකි. (    )

6) ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු.2000 කි. 2021.04.01 දින සුළු මුදල් භාරකරු අත වූ මුදල රු.150කි. අප්‍රේල් මාසය අවසානයේදී අග්‍රිමය තව රු.1,000කින් වැඩි කරන ලදී. 2021.04.30 දින රු.200ක් සුළු මුදල් භාරකරු අත පැවතුණි.

2021.04.01 දින සහ 2021.04.30 දින ප්‍රතිපූර්ණය කළ මුදල් ප්‍රමාණය පිළිවෙළින් දක්වන්න.

7) බැංකු ප්‍රකාශයේ අගය, මුදල් පාලන ගිණුම සංශෝධනය කිරීමට පෙර ඇති වටිනාකමට වඩා වැඩි වීමට හේතු මොනවාද?

8) 2021.03.31 දිනට ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ ශේෂය රු.210,000ක අයිරාවකි. එදිනට එම ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂයට සමාන නොවේ. එයට හේතු නම්,

- බැංකු ගාස්තු වූ රු.1,000 පොත්වල සටහන් නොවීම.
- ව්‍යාපාරය විසින් නිකුත් කළ රු.50,000ක චෙක්පත බැංකුවට ඉදිරිපත් වී නොතිබීම.

2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු මුදල් ශේෂය හා 2021.03.31 දිනට බැංකු ප්‍රකාශයේ ශේෂය පිළිවෙලින් වන්නේ,

(1) රු. 209,000 (හර), රු. 259,000 (බැර)
(2) රු. 209,000 (බැර), රු. 259,000 (හර)
(3) රු. 211,000 (බැර), රු. 161,000 (හර)
(4) රු. 161,000 (හර), රු. 211,000 (බැර)
(5) රු. 211,000 (හර), රු. 161,000 (බැර)

9) ව්‍යාපාරයක සංශෝධිත මුදල් පාලන ගිණුමේ ශේෂය රු.150,000 කි. ව්‍යාපාරයේ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකමට වඩා තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් වල වටිනාකම රු.10,000 කින් වැඩිය. එසේ නම් එම ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශයට අනුව ශේෂය කොපමණද?

10) 2021/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත X සමාගමේ උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ණයට විකුණුම් | 150,000 |
| දුන් වට්ටම් | 2,000 |
| ආපසු එවුම් | 5,000 |
| ලද වට්ටම් | 3,000 |
| ණයගැති ලැබීම් | 50,000 |
| ලද චෙක්පතක් අගරු වීම | 1,000 |
| අඩමාණ ණය සඳහා වෙන් කිරීම | 500 |
| බොල්ණය | 3,000 |
| ආපසු ලද බොල්ණය | 250 |

1. 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් දැක්විය යුතු වෙළඳ ලැබිය යුතු දෑ වල වටිනාකම කොපමණද ?
2. වෙළඳ ලැබිය යුතු දෑ වලට අදාළව ලා/ලා ප්‍රකාශයේ හඳුනාගත යුතු මුළු වියදම කොපමණද ?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව